# අධ්‍යයනයේ සාරාංශය

වර්තමාන සංකීර්ණ සමාජයක ජීවත්වන මිනිසා අනාගතයේ දී පා තබන ලෝකය හාත්පසින් ම වෙනස් විය හැකිය. එහි දී මෙම වෙනස්වන ලෝකයට උචිත මෙන් ම ඔරොත්තු දිය හැකි පුද්ගලයකු බිහි කිරීම අධ්‍යාපනය තුළින් අපේක්ෂිතය. ද්විතියික අධ්‍යාපනය විධිමත් ලෙස ස්ථාපිත වීමේ තිරක සාධකය ප්‍රාථමික අධ්‍යාපනය වෙත යොමු වේ. මෙනිසා ලෝකයේ බොහෝ රටවල් ප්‍රාථමික අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය සඳහා විවිධ වූ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. ඒ අනුව ශ්‍රී ලංකාවේ වර්තමාන අධ්‍යාපන ක්ෂෙත්‍රයේ ප්‍රාථමික අධ්‍යාපනය නවීකරණය වී ඇත. 1997 ක්‍රියාත්මක කරන ලද අධ්‍යාපන ප්‍රතිසංස්කරණයන්ට අනුව ප්‍රාථමික ශ්‍රේණිවල සිසුන්ගේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ක්‍රියාකාරී බවින් පාඩමට සම්බන්ධ කර ඉගෙනුම් ආශාව වර්ධනය කිරීම බලාපොරොත්තු වෙයි.

ඒ අනුව ප්‍රාථමික පන්ති පාදක ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී සිසුන්ගේ ක්‍රියාකාරී ස්වභාවය පිළිබඳ කරුණු අධ්‍යයනය කිරීම මෙම නිබන්ධනයේ මූලික අධ්‍යාශය වී ඇත. ප්‍රාථමික අධ්‍යාපනය අවධීන් 03ක් යටතේ විකාශනය වෙයි. ඒ අවධීන් හි පන්තිකාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියෙහි සිසුන්ගේ ක්‍රියාකාරිත්වය කෙසේ සිදු වේදැයි යන්න විමසීම මෙම අධ්‍යයනයේ එක් ප්‍රධාන අරමුණක් වී ඇත. ශ්‍රී ලංකාවේ ප්‍රාථමික අධ්‍යාපනය සම්බන්ධයෙන් ක්‍රියාත්මක කරනු ලබන බොහෝ වැඩසටහන්වල ගුණාත්මක බව අපේක්ෂිත අයුරින් පන්ති කාමර තුළ දී සිදුවන්නේ ද යන්න විමසා බැලීම කාලෝචිතය. මන්ද ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී අපේක්ෂිත අරමුණු කෙරෙහි සෑම සිසුවකුම සාර්ථකව ළඟා වී ඇත්දැයි බලාපොරොත්තු වීම නිසයි. මෙහි දී අපේක්ෂිත අරමුණු සාධනය වීමේ දී අනාවරණය වන ඉගෙනුම් ඉගැන්වීම් දුෂ්කරතා මඟහරවා ගැනීමේ ප්‍රතිකාර්ය ඉගෙනුම් ඉගැන්වීම්වල ස්වභාවයත් අවබෝධ කර ගැනීම ද මෙම අධ්‍යයනයෙන් අපේක්ෂිත තවත් එක් සාධකයකි.

දෙවන ප්‍රධාන අවධියේ දී සැලසුම් ගත සෙල්ලම්, විනෝදජනක වැඩ, ක්‍රියාකාරකම් හා අසුන්ගත වැඩ යන ක්‍රම 3ට ම ආසන්න වශයෙන් සමාන අවධානයක් හිමි වෙයි. එහි දී සිසුන්ගේ ක්‍රියාකාරිත්වයට අනුව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමශිල්ප පන්තිකාමරය තුළ ක්‍රියාවට නැංවේ ද යන්න අවබෝධ කර ගැනීම මෙමගින් අපේක්ෂිතය.

මෙම අධ්‍යයනය සඳහා ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක හා පාසල් වර්ග නියෝජනය වන පරිදි ස්ථරගත අහඹු නියැදි ක්‍රම ශිල්පය අනුව පානදුර අධ්‍යාපන කොට්ඨාශයේ 2 වර්ගයේ පාසල් 08ක් තෝරා ගන්නා ලදි. එම පාසල්වල ඇති සමාන්තර පන්තිකාමර අතරින් 3 හා 4 ශ්‍රේණියන්හි පංති 01 බැගින් පන්ති 16ක් එම ශ්‍රේණි භාර ගුරුමහත්ම මහත්මීන් 16 දෙනාගේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමශිල්ප නිරීක්ෂණ පත්‍රිකාවකට අනුව නිරීක්ෂණය කිරීම ද එක් ශ්‍රේණියකින් අහඹු ලෙස තෝරාගන්නා

සිසුන් 10 බැගින් සිසුන් 160 දෙනකුගේ දෙමාපියන් වෙත ලබාදෙන ප්‍රශ්නාවලියක් ඇසුරින් ද එම පාසල් 08 හි විදුහල්පතිවරුන් 08 දෙනා සමග ෂෙඩ්‍යුලයකට අනුව පැවැත්වූ සම්මුඛ සාකච්ඡාවක් මගින් හා ගුරුභවතුන්ට ලබාදෙන ප්‍රශ්නාවලියක් ඇසුරින් අදාළ දත්ත රැස් කිරීමට යොමු විය.

ප්‍රාථමික දෙවන අවධියේ සිසුන්ගේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ළමා ක්‍රියාකාරීත්වය සිදුවන ආකාරය සුවිශේෂ කොට ගැනීම නිසා විස්තරාත්මක පර්යේෂණ ක්‍රමය භාවිත කර ඇත. ගුරුභවතුන්ට ලබාදෙන ප්‍රශ්නාවලිය ඇසුරින් ද විදුහල්පතිවරුන් සමග පැවැත්වූ සම්මුඛ සාකච්ඡාවට අනුව පන්තිකාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ ළමා ක්‍රියාකාරීත්වයේ ස්වභාවය පාසල තුළ කවරාකාර ස්වභාවයක් ද යන්න තවදුරටත් පරීක්ෂාවට භාජනය කරන ලදී.

අධ්‍යනයේ නිගමනයන්ට අනුව පන්තිකාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ ළමා ක්‍රියාකාරීත්වයට අදාළව ඉගෙනුම් ක්‍රියාවලිය සාර්ථක ලෙස පන්ති කාමරයේ ක්‍රියාත්මක නොවන බව පැහැදිලි විය.

එහිදී මෙම ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේදී ළමා ක්‍රියාකාරීත්වය වැඩි කිරීමෙහි දී ගුරු අවධානය වඩාත් යොමුවීමේ අවශ්‍යතාවය අධ්‍යයනයේ දී නිගමනය විය. එහි දී ශිෂ්‍යයින්ගේ කුසලතා හා ඉගෙනුම් ආශාවන් වර්ධනය සඳහා නව ප්‍රතිකාර්ය ඉගෙනුම් ක්‍රමයන්හි අවශ්‍යතාවය පිළිබඳ විශේෂ අවධානය යොමුකර යෝජනා ඉදිරිපත් කර ඇත.

ප්‍රාථමික අංශය තුළ පවතින ශිෂ්‍ය නොහැකියාව අවම කර සාර්ථකත්වයක් ලබා ගැනීම උදෙසා පාසල් පද්ධතිය තුළ ප්‍රාථමික අංශයේ හඳුනාගත් එක් කුඩා සංඝටකයක් තුළින් ප්‍රාථමික අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයට අත්වැලක් සැපයීම උදෙසා මෙම අධ්‍යයනය දියත් කරන ලදී.